MRCA/F/1/4/1 2019.05.

ලේකම්
රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

පාර්ලිමේන්තු සැසිවාර අංක : 76

ආයතනය : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

අනු අංකය	මූල්‍ය හා කාර්ය සාධනය ඇගයීමේදී කමිටුව විසින් හඳුනා හඳුනා ගන්න ලද අඩුපාඩු / ලබා දෙන ලද මඟ පෙන්වීම්	එම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග /ක්‍රියාත්මක කරන ලද නිර්දේශ / වත්මන් තත්වය
01.	මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට මුදල් ලබාදුන් දේවස්ථාන පිළිබඳ තොරතුරු ක්‍රමවත් අයුරින් පවත්වාගෙන ගොස් නොතිබීම.	අදාල දේවස්ථාන පිළිබඳ තොරතුරු ඇමුණුම A හා B ලෙස යා කොට ඇත. කාරක සභාවේ නිර්දේශය පරිදි මේ වනවිට පිළිගත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී. එනම් දිවයිනේ පිහිටි සියළු ලියාපදිංචි ඉස්ලාම් දේවස්ථානයන්හි තොරතුරු පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය මේ වනවිටත් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත. මේ සඳහා භෞතික පරීක්ෂාවක් සිදු කර අදාළ තොරතුරු එකතු කිරීම සඳහා දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් හා දෙපාර්තමේන්තු නිලධාරීන් යොදවා ඇත. මේ වනවිට 50% කට ආසන්න දේවස්ථාන වල තොරතුරු ලබාගෙන ඇති අතර, ඒවා පරිගනකගත කිරීමේ කාර්යය සිදු වෙමින් පවතී. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ මෙම තොරතුරු ලබාගැනීමේ හැකියාවද පවතී.
02.	2015 වර්ෂයේ මුස්ලිම් දේවස්ථාන සඳහා රු.මිලියන 29 ක මූල්‍ය ආධාර	2015 -2016 වසර වලට අදාළව තෝරාගත් මුස්ලිම් දේවස්ථානවල සංවර්ධන කටයුතු සඳහා දෙපාර්තමේන්තුව

	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 59 හරහා නිකුත් කර ඇති අතර ඒවා උපයෝජනය කර ඇති ආකාරය පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමේ පසුවිපරමක් සිදු වී නොමැත. 2016 වර්ෂයේ දේවස්ථාන සහ දහම් පාසැල් සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් රු.මිලියන 36 ක මුදල සඳහා ලදුපත් ඉදිරිපත් කර තිබුනේ රු.මිලියනයකට පමණි.	විසින් චෙක්පතකින් මුදල් නිදහස් කරනු ලැබුවේ අදාල කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් වෙතය. එහිදී අදාල ව්‍යාපෘති නිමකිරීමෙන් අනතුරුව එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රගති වාර්තා හා ව්‍යාපෘතියේ වියදම් වෙනුවෙන් ගෙවීම් සිදු කරන ලද බිල්පත් ඇතුළු සියළු ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලෙස දැනුම් දී ඇතත් එසේ එවන ලද ලේඛණ ගොණුවලින් සොයා ගැනීමේ අපහසුවක් පවතී. ලදුපත් ලබාදීම විධිමත් නොවීම හා වෙනත් ප්‍රායෝගික ගැටළු සළකා බලා දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ සිට නව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව 2017 වසරේ සිට අදාළ දේවස්ථාන වෙත සෘජුවම මුදල් ලබාදීම නවත්වා, ඒවා පිහිටි අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත **මුදල් ප්‍රතිපාදන පමණක්** නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අදාළ මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නියමිත දේවස්ථාන වෙත ලබා දීමට පියවර ගනු ලබයි. එනිසා මුදල් ලබා දීම වෙනුවෙන් ලදුපත් ලබාගැනීමේ අවශ්‍යතාවය පැන නොගින අතරම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟද මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙන යනු ලබයි. එලෙසම ප්‍රාග්ධන අරමුදල් යොදවා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසා බැලීම පිණිස සෑම මසකම 05 වන දිනට පෙර ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය නියමිත ආකෘති පත්‍රය ප්‍රකාරව ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වරු වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.
03.	හජ් අරමුදලේ වර්තමාන තත්ත්වය	හජ් වන්දනාව විධිමත් කිරීම පිණිස 2017 වසරේ සිට පරිගණක මාර්ගගත වැඩසටහනක් (Online system) හඳුන්වා දෙන ලදි. ඉස්ලාම් පල්ලි හා පුවත්පත් හරහා මේ පිළිබඳව ජනතාව දැනුවත් කර, 2018.11.30 දින සිට පූර්ණ වශයෙන්ම මෙම ක්‍රමය මඟින්ම ඉල්ලුම්පත්‍ර භාරගැනීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව හජ් වන්දනාව සඳහා සෑම අයෙකුටම එක් වතාවක් හෝ සහභාගි වීමේ ඉඩ ප්‍රස්ථාව මේ වනවිට සැලසී ඇත.

එස්.එම්. මොහොමඩ්
ලේකම්

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු
අමාත්‍යාංශය

එම්.ආර්.එම් මලික්
අධ්‍යක්ෂ

මුස්ලිම් ආගමික හා සංස්කෘතික
කටයුතු දෙපාර්තමේන්තුව